# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1707/14 - 2011 මැයි 25 වැනි බදාදා - 2011.05.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : CI/220/2002.

**කාර්මික ආරවුල් පනත-131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2004.09.22 දින දරන නියෝගයෙන් එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416හි ජාතික සේවක සංගමය හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, රොබට් ගුණවර්ධන මාවත, අංක 59හි පිහිටි බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමුකරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2011.04.07 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2011 මැයි මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

එක් පාර්ශවයක් වශයෙන්,

නඩු අංකය : ඒ/3067

ජාතික සේවක සංගමය,
අංක 416, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

ඉල්ලුම්කරු



සහ අනෙක් පර්ශවය වශයෙන්,

බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී
ප්‍රවාහන අධිකාරිය,
අංක 59, රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

වගඋත්තරකරු.

අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳව කෙරෙන

ප්‍රදානයයි

එකී ආරාවුල කම්කරු සබඳතා සහ විදේශ රැකියා නියුක්ති අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න මහතා, 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන දරන පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මහරගම පමුණුව පාරේ, අංක 216/8හි, කේ. ඒ. ඩී. බී. කරුණාරත්න වන මා පත් කරනු ලැබ එකී ආරාවුල 2004.09.22 වැනි දිනැති ලිපිය මගින් මා වෙත යොමු කරනු ලැබීය.

2004.08.27 වැනි දිනැති ලිපිය මගින් කම්කරු කොමසාරිස්වරයා විසින් එකී කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය පහත දැක්වෙන අයුරින් නියම කර ඇත.

''බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 1997 වර්ෂයේ දී සිදු කරනු ලැබූ වැටුප් ප්‍රතිසංවිධානය පරිදි එම

අධිකාරියේ මාර්ග පරීක්ෂක එම්. කරුණාදාස මහතා 1997.01.01 වැනි දින සිට V ශ්‍රේණියේ පිහිටුවා එයට අදාල වැටුප් ක්‍රමය ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ද යන්න හා නොඑසේ නම් ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව ද වේ''.

*ඉල්ලුම්කරුගේ ප්‍රකාශය ඃ*

2004.01.22 දිනැතිව, ඉල්ලුම්කරුගේ ප්‍රකාශය අනුව මෙසේ පවසා ඇත.

01. පැමිණිලිකාර කරුණාදාස 1985 වසරේ සිට, බස්නාහිර පළාත් බස් ධාවන සමිතියේ මාර්ග පරීක්ෂකයකු වශයෙන් සේවයට බඳවාගෙන ඇත.

02. 1992.05.05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ, ස්ථාන පාලන නිලධාරී තනතුර පිරිනමා ඇත.

03. 1993.03.17 වැනි දිනැති ලිපිය මගින්, 1992.05.05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි II වැනි ශ්‍රේණියේ පරීක්ෂක නිලධාරී තනතුර පිරිනමා ඇත.

04. 1992 සිට 1994 දක්වා වූ කාලය තුළ I වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුරු දැරූ සියලුම නිලධාරීන් හට විධායක ශ්‍රේණියේ විවිධ තනතුරු මත උසස්වීම් ලබාදෙන ලදී.

05. එසේ I වැනි ශ්‍රේණියේ දැරූ මාර්ග පරීක්ෂකවරුන් හට විවිධ උසස්වීම් ලබාදීම නිසා ඇති වූ I වැනි ශ්‍රේණියේ උසස් වීම සඳහා II වැනි ශ්‍රේණිය දරමින් සිටි මාර්ග පරීක්ෂකවරුන් හට I වැනි ශ්‍රේණිය ලබා දිය යුතු වුව ද එවැන්නක් සිදු නොවීම මවිතයට හේතු වේ.

06. එපමණක් නොව, 1997 වසර දක්වාම I වැනි ශ්‍රේණියට උසස්වීමක් ලබා නොදීමෙන් කරුණාදාස මහතාට බරපතළ අසාධාරණයක් සිදු කර ඇත.

07. මේ අතර පාලන අධිකාරිය විසින් 1997 වසරේදී කාර්ය මණ්ඩලය නව ශ්‍රේණිගත කිරීමක් සිදු කරන ලදී.

08. 1994 සිට කරුණාදාස මහතට I වැනි ශ්‍රේණිය ලබාදී තිබුණේ නම් 1997 වසරේ සිදු කළ ශ්‍රේණි සංශෝධනයේදී ඔහුට හිමි වන්නේ V වැනි ශ්‍රේණියයි.

09. 1994 සිට 1997 දක්වාම පුරප්පාඩු තිබියදී ඔහුට I වැනි ශ්‍රේණිය ලබා නොදී, II ශ්‍රේණිය මතම සේවය කිරීමට සිදු වීම නිසා, ඔහුට ලැබී අත්තේ VI වැනි ශ්‍රේණියයි.

1985 වසරේ සිට මාර්ග පරීක්ෂක තනතුර මත සේවය කර ඇති කරුණාදස මහතාට සිදු වී ඇති බරපතල අසාධාරණයන්ට සාධාරණය ඉටු කිරීම් වස්, පහත සඳහන් සහනයන් ලබා දෙන මෙන් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටිමු.

(අ) 1994 වසරේදී I වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂකවරුන්ට විවිධ තනතුරු මත උසස්වීම් ලබා දී ඇති බැවින්, I වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුරේ උසස්වීමක්, 1994 සිට හිඟ වැටුප් සහිතව ලබාදෙන මෙන් ද,

(ආ) ඒ අනුව, 1997 වසරේ දී සිදු කළ ශ්‍රේණි සංශෝධනයේ දී හිමි විය යුතු I වැනි ශ්‍රේණියේ අනුප්‍රාප්තික ශ්‍රේණිය වූ V වැනි ශ්‍රේණිය එදින සිට ක්‍රියාත්මක වන පරිදි, හිඟ වැටුප් සමග ලබාදෙන මෙන් ද ගෞරවයෙන් ඇයද සිටිනු ලැබේ.

2004.12.10 වැනි දින මේ කරුණ විභාගයට ගත් විට ඒ දිනය දක්වා වුවද වගඋත්තරකාර පක්ෂයේ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

ඒ තාක් කල්, වගඋත්තරකාර පක්ෂයේ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබීම ගැන අධිකරණය සිය අප්‍රසාදය මේ සමග පළ කර සිටී.

2005.01.20 වැනි දින මේ කරුණ විභාගයට ගත්විට වගඋත්තරකාර පක්ෂයේ උගත් නීතිඥ රාජපක්ෂ මහතා පවසා සිටියේ, සිය ප්‍රකාශය තවමත් අවසන් කර නොමැති බවයි.

*වගඋත්තරකරුගේ ප්‍රකාශය ඃ*

2005.01.20 වැනි දිනැතිව වගඋත්තරකරුගේ ප්‍රකාශය ඉදිරිපත් කර ඇත. එහි ප්‍රමුඛ වශයෙන් සඳහන් කර ඇත්තේ ''1997.01.01 දින සිට V වැනි ශ්‍රේණියේ පිහිටුවා ඊට අදාල වැටුප් ක්‍රමය ලබා ගැනීමට එම්. කරුණාදාස මහතාට හිමිකමක් නොමැතිය'' යන්නය.

01. 1993.03.17 වැනි දිනැති පත්වීම් ලිපිය මගින් 1992.05.05 වැනි දින සිට බලපවත්වන පරිදි, II වැනි ශ්‍රේණියේ පරීක්ෂක නිලධාරී තනතුරක් මෙම නිලධාරී තැන වෙත පිරිනමා ඇත.

02. 1997 වර්ෂයේ දී අධිකාරියේ කාර්ය මණ්ඩලය ශ්‍රේණිගත කිරීමේදී මොහු VI ශ්‍රේණියේ ස්ථාපනය කර ඇත.

03. 1992.05.05 වැනි දින මෙම අධිකාරිය පිහිටුවීමේදී කාර්යය මණ්ඩලය විධිමත් ලෙස ශ්‍රේණිගත කිරීමක් සිදු කර නොමැති බැවින්, 1997 වර්ෂයේ දී එය සිදු කර ඇත.

04. එහිදී II ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුරුවල සේවයේ යෙදී සිටි සියලුම නිලධාරීන්ට පිරිනමා ඇත්තේ VI වැනි ශ්‍රේණිය වේ.

05. මෙහිදී මෙම නිලධාරී තැන ද VI වැනි ශ්‍රේණියේ ස්ථාපනය කර ඇත.

2005.03.18 වැනි දින ඉල්ලුම්කාර පක්ෂයේ සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලදී. පළමුවෙන්ම කඩුවෙල ඉහළ බෝමිරියේ පදිංචි එම්. කරුණාදාස, එනම් ඉල්ලුම්කරු සාක්ෂි දුන්නේ ය.

ඉල්ලුම්කරු බොරැල්ල කොටුවේ පෞද්ගලික බස්රථ හිමියන්ගේ සංගමයේ 1982 සිට 1985 දක්වා සේවය කළ බවත්, 1992 දී ප්‍රඥප්තියක් මත අධිකාරියක් පිහිට වූ බවත් පැවසීය, එසේ 1992න් පසුව ඔහුට වැටුප් ගෙවන ලද්දේ අධිකාරිය විසින් බවත් තවදුරටත්

පැවැසීය. ඒ අනුව 1991.11.01 දක්වා අඛණ්ඩ සේවයක් කර ඇත. බස්රථ ධාවන සමිතිවල සිටි සියලුම සේවකයන් එනම්, බස්නාහිර පළාතේ සේවකයන් 540ක් අධිකාරියට බඳවා ගන්නා ලදහ, 1985 වර්ෂයේ සිටම ස්ථානභාර නිලධාරී වශයෙන් කටයුතු කර ඇත. පසුව මාර්ග පරීක්ෂකවරයකු වශයෙන් 1992 සිට අඛණ්ඩව II ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක ලෙස සේවය කළ බව ද පැවැසීය, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ 1992.05.05 වැනි දින සිට II ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුරට පත් කළ පැ. 4 ලිපිය අනුව II ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුරෙහි වැටුප් පරිමාණය වර්ෂයකට රු. 19,680-480x9-600x8-රු. 28,800ක් විය. මෙම වැටුප් පරිමාණයේ රු. 19,680 වැටුප් තලය මත ඔහු තබන ලද බවත්, 1992, 1993 යන වර්ෂවල මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පරීක්ෂකවරු 7, 8 දෙනෙක් සිටි බව ඔහුට මතකය. I වැනි ශ්‍රේණියේ අයට වෙනත් තනතුරු මත උසස්වීම් ලබාදීමෙන් අනතුරුව, ඔහුට I වැනි ශ්‍රේණියට උසස්වීමක් ලැබුණේ නැති බව ඔහු පැවසීය. 1997 වන විට ඔහු II වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂකයෙක් විය. අධිකරණයට පිළිතුරු දෙමින් 1997 සංශෝධනය අනුව I වැනි ශ්‍රේණිය තමයි, උසස්ම ශ්‍රේණිය යනුවෙන් ඔහු පිළිතුරු දුන්නේ ය. පැ. 6 එනම්, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කාර්ය මණ්ඩල ශ්‍රේණිගත කිරීමේ කමිටු වාර්තාවේ පිටපතක් ඉදිරිපත් කරන ලදී. පැ. 6 අනුව සංශෝධන 4ක් තිබෙන බවත්, V වැනි ශ්‍රේණියේ සහ VI වැනි ශ්‍රේණිය ලෙස කණ්ඩායම් 2ක් එහි සඳහන් කර ඇති බවත් සාක්ෂිකරු පැවසීය. 1997 සංශෝධනයේ දී ඔහුට ලැබිය යුත්තේ V වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුර බව පැවැසූ සාක්ෂිකරු ජ්‍යෙෂ්ඨ මාර්ග පරීක්ෂකවරයකුගේ වැටුප රු. 41,520-8x1,200-10x1,560-රු. 66,720 ක් විය. II වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුරේ වසර 12ක් සේවය කර ඔහුට ශ්‍රේණි උසස්වීමක් නොදුන් බවට අධිකරණයේ අවධානය යොමු කරන ලදී.

ඉල්ලුම්කරුට සිදු වූ අසාධාරණය සම්බන්ධව, සාධාරණයක් ඉටු කරන ලෙසට වාචිකව ඉල්ලා සිටි අතර කම්කරු දෙපාර්තමේන්තුවට ද, ඒ ගැන පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදුව කාර්මික සම්බන්ධතා අංශයේ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් සිල්වා මහතා පරීක්ෂණයක් පවත්වන ලද බව පැමිණිලිකරු සාක්ෂි දෙමින් පැවසීය. එකී පරීක්ෂණයට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ එවකට සිටි සාමාන්‍යාධිකාරී හැරී ජයතුංග මහතා ද සහභාගී වූ බවත් එම පරීක්ෂණය අවු. 1 1/2ක් පමණ පැවැතුණු බවත් පැවසීය. එකී නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ වාර්තාව පැ. 8 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එහි 3 වැනි ඡේදය මෙසේ ය.

"ඒ අනුව මොහුට I වැනි ශ්‍රේණිය 1994 සිට හිමි වන අතර 1997 දී සිදු කරන ලද වැටුප් හා ශ්‍රේණි ප්‍රතිසංවිධානයේදී ඊට අනුරූපී V වැනි ශ්‍රේණිය හිමි විය යුතු බවත් දන්වන අතර, 1997 සිට V වැනි ශ්‍රේණිය හා ඊට අදාල වැටුප් හා හිඟ වැටුප් ගෙවීමට කටයුතු කරන ලෙස ද දැනුම් දෙමි. ඒ අනුව මෙම සේවකයාට අදාල ගෙවීම් කර දින 14ක් ඇතුළත වාර්තා නොකළ හොත් කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ බේරුම්කරුවකු වෙත යොමු කිරීමට කටයුතු කිරීමට සිදු වන බවත් වැඩිදුරටත් දැනුම් දෙමි".

මෙම නියෝගයේ පිටපතක් අංක සීඅයි/220/2002 හා 2004.01.14 දිනැතිව බස්නාහිර පළාතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති වෙත යවා ඇත.

කම්කරු කොමසාරිස්තුමාගේ එකී නිර්දේශය පරිදි අදාල සහනයක් අධිකාරිය විසින් මෙතෙක් ලබා දී නැති බව ද සාක්ෂිකරු තවදුරටත් පැවසීය.

ඔහු අවසාන වශයෙන් අධිකාරණයෙන් ඉල්ලා සිටියේ කම්කරු කොමසාරිස්තුමා දැනුම්දුන් පරිදි 1997.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මාර්ග පරීක්ෂක V ශ්‍රේණියේ තනතුර ලබාදෙන ලෙසයි.

මෙතනින් මූලික සාක්ෂි අවසන් විය.

2005.08.26 වැනි දින මේ කරුණ විභාගයට ගත් විට වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ රාජපක්ෂ මහතා හදිසියේ අසනීප වීමෙන් එදින නඩු විභාගයට සහභාගී වීමට නොහැකි බව පවසා ඔහුට පහසු දින කිහිපයක් යෝජනා කරන ලදී. ඒ අනුව වැඩිදුර විභාගය 2005.09.30 වැනි දින නියම කරන ලදී. එදින ඉල්ලුම්කාර කරුණාදාසගෙන් හරස් ප්‍රශ්න ඇසීම ආරම්භ විය.

කම්කරු කොමසාරිස්තුමා වෙත ඔබ කළ ඉල්ලීම අනුව 1997 වර්ෂයේ දී සිදු කරන ලද වැටුප් ප්‍රතිසංවිධානය පරිදි එම අධිකාරියේ මාර්ග පරීක්ෂක වන තමා 1998.01.01 වැනි දින සිට V ශ්‍රේණියේ පිහිටුවා ඊට අදාළ හිඟ වැටුප් ලබා ගැනීමට ඉල්ලා සිටියා නේද ? යන ප්‍රශ්නයට ඉල්ලුම්කරු පහත දැක්වෙන පිළිතුරු දුන්නේ ය. "ඔව්, එම ඉල්ලීම අනුව II ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක වශයෙන් සේවය කරන මාහට 1994 සිට I වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුර ද 1997 වැටුප් සංශෝධනයේ දී හිමි විය යුතු V ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුර හිඟ වැටුප් සමග ලබාදෙන මෙන් ඉල්ලා තිබෙනවා,'' තව ද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කම්කරු කොමසාරිස්තුමා මෙම බේරුම්කරණයට ඉල්ලීමක් ඉදිරිපත් කර තිබේ යැයි ද එම ඉල්ලීම 2004.08.27 වැනි දින යොමුවේ සඳහන් කර ඇති බව සාක්ෂිකරු පැවසීය.

පැ. 2 වශයෙන් ලකුණු කළ ලේඛනය මගින් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ රැකියාවක් ලැබුණු බවත් පත්වීමේ ලිපිය අනුව පරිවාස කාලයකට යටත් කළ බවත්, ඉල්ලුම්කරු පිළිගත්තේ ය. ඒ අනුව 1992.05.05 වැනි දින සිට II වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක නිලධාරියකු වශයෙන් හිඟ වැටුප් සහිතව පත්කරනු ලැබූ බව සාක්ෂිකරු පිළිගත්තේ ය.

II ශ්‍රේණියේ සිටි ඉල්ලුම්කරු 1997 වැටුප් සංශෝධනයෙන් පසුව VI ශ්‍රේණියට පත් කළ බව ඉල්ලුම්කරු පිළිගනී.

2005.12.02 වැනි දින මෙම කරුණ වැඩිදුර විභාගයට ගත්විට වගඋත්තරකාර අධිකාරිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ නිමල් රාජපක්ෂ මහතාට ඇති වූ රෝගී තත්ත්වයක් නිසා පැමිණීමට නොහැකි බව දන්වා සිටි බව එම දිනයේ පැමිණ සිටි අධිකාරියේ පාලන කළමණාකරු විජේසිරි මහතා අධිකරණයට දැනුම් දුන්නේ ය.

2006.01.12 වැනි දින හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්න අවසන් විය.

2006.03.01 දින මේ කරුණ විභාගයට ගත්විට වගඋත්තරකාර අධිකාරිය වෙනුවෙන් එහි උගත් නීතිඥවරයා හෝ වෙනත් කිසිවකුත් හෝ පැමිණ නොසිටියේ ය. එසේ නොපැමිණීම ගැන අධිකරණය

කිසිසේත්ම සතුටට පත්විය නොහැකි කරුණක් යැයි නිරීක්ෂණය කර ඇත.

අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂිදීමට කැඳවන ලෙසට මෝසමක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව ඔහු වෙත ලියාපදිංචි තැපෑලෙන් නිවේදනයක් යවා ඇත. එහෙත් 2006.06.22 වැනි දින පෞද්ගලික කාරණයක් මත ඔහු අධිකරණය ඉදිරියේ පෙනී සිටියේ නැත.

2006.07.25 වැනි දින සාමාන්‍යාධිකාරී හැරී ජයතුංග මහතා ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණ සිටියේ ය.

පැමිණිලිකරු වෙනුවෙන් වගඋත්තරකාර අධිකාරීයේ සාමාන්‍යාධිකාරී හැරී ජයතුංග මහතාගෙන් දින කිහිපයක්ම දීර්ඝ ලෙස මූලික සාක්ෂි අසා, හරස් ප්‍රශ්න ඇසීම ද දින කිහිපයක් තුළ පවත්වා ඇත. ඔහු සේවයෙන් විශ්‍රාම ගෙන ඇති බැවින් නොයෙක් වර අධිකරණයට පැමිණෙන ලෙසට සිතාසි යවන ලද නමුත්, ඔහු අධිකරණයට දිගින් දිගටම පැමිණ නොසිටියේ ය. හරස් ප්‍රශ්න ඇසීම ද, නැවත ප්‍රශ්න ඇසීම ද, අවසන් වී නොමැත. වගඋත්තරකාර අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි කළමණාකරු (පාලන) තිලක් කුමාර වීරසිංහ මහතා පැවසුවේ, හැරී ජයතුංග මහතා විශ්‍රාම ගොස් ඇති බැවින් නොතිසී භාරදීම ආයතනයට කළ නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවයි.

2009.06.11 වැනි දා මේ කරුණ විභාගයට ගත් විට එදින ද හැරී ජයතුංග පැමිණ සිටියේ නැත.

මේ තත්ත්වය යටතේ වගඋත්තරකාර අධිකාරියේ උගත් නීතිඥ රාජපක්ෂ මහතා මෙසේ ප්‍රකාශයක් කළේ ය. "හැරී ජයතුංග නමැති සාක්ෂිකරුගේ සාක්ෂිය හරස් ප්‍රශ්න වලට භාජනය කිරීම සඳහා නැවත ප්‍රශ්න වලට පත් නොවීම මත එම සාක්ෂිය ඉවත් කරන ලෙස ඉල්ලා සිටිමි. දැනට එම සාක්ෂිකරුට ගරු බේරුම්කරණය විසින් දින කිහිපයක් නොතීසි නිකුත් කර ඇතත්, එම සාක්ෂිකරු පැමිණ නැති බව පෙනී යයි. එසේම මෙම සාක්ෂිකරු දැනට ඔහු දරන තනතුරෙන් විශ්‍රාම ගොස් සිටින සේවකයෙකි. මේ අනුව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය නඩු විභාගයේ දී අදාළ කර නොගන්නා ලෙස ඉල්ලා සිටී."

වගඋත්තරකාර පක්ෂයේ උගත් නීතිඥවරයාගේ මෙම ඉල්ලීම සාධාරණ බව අධිකරණයේ හැඟීමයි. තව ද හැරී ජයතුංග නමැති මේ සාක්ෂිකරු සාක්ෂියට කැඳවා ඇත්තේ ඔහුගේ අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් එක්තරා විධියකට සිය අධිකාරියට එරෙහිව සාක්ෂිදීමට කැඳවා ඇති බවයි. ඇතැම් විට ඔහු මූලික සාක්ෂිදීමේදීත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීමේදීත් ඔහු මහත් අකමැත්තකින් සාක්ෂිදුන් බව අධිකරණය නිරීක්ෂණය කරයි. එබැවින් ඔහුගේ සාක්ෂිය එකහෙළාම පිළිගැනීමට තරම් විශ්වාසනීයත්වයක් නැති බව අධිකරණය නිරීක්ෂණය කරයි. එවන් නිරීක්ෂණයක් සහ වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයාගේ ඉල්ලීම ගැන සලකා බලා හැරී ජයතුංගගේ සාක්ෂිය මේ නඩුවේදී අදාළ කර නොගැනීමට මම තීරණය කරමි.

ඊළඟට පැමිණිලිකරු වෙනුවෙන් තවත් සාක්ෂිකරුවෙකු කැඳවනු ලැබීය. එහු මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සහකාර කළමණාකරු පියසිරි ලියනගේ ය. ඔහු දැනට සේවය කරන්නේ, මගී ප්‍රවාහන අධිකාරියේ බවත්, අවු. 17ක් පමණ එහි සේවය කර ඇති බවත්, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවය 1992.02.05 වැනි දින ආරම්භ කළ බවත් පැවසීය. පැ. 20 යනු පළාත් පාලන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පත්වීමේ ලිපියයි. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ II පන්තියේ බස්රථ පරීක්ෂක තනතුරෙහි 1991.11.15 වැනි දින සිට වැඩ කළ බවත්, එම දෙපාර්තමේන්තුව අහෝසි කරනු ලැබ, ඔවුන් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට අන්තර්ග්‍රහණය කළ බවත් පැවසීය.

දැනට අධිකාරියේ සිටින මාර්ග පරීක්ෂකවරයන්ගේ සේවය අනුව ඔවුන්ගේ ශ්‍රේණිය VI වැනි ශ්‍රේණියයි. 1997 වසරේ නව ශ්‍රේණි සංශෝධනය ක්‍රියාත්මක වීමට පෙර, II ශ්‍රේණිය දැරූ මාර්ග පරීක්ෂක නිලධාරීන් පිරිසක් සේවය කළ බව පිළිගත් සාක්ෂිකරු ඔහු අධිකාරියට පැමිණියේත්, මාර්ග පරීක්ෂක II ශ්‍රේණියට බවත් පැවසීය. එසේ සේවය කරමින් සිටියදී ඔහුට ධාවන සහායක තනතුරට උසස්වීමක් ලද බව පැවසීය. එම උසස්වීමේ ලිපිය පැ. 21 වශයෙන් ලකුණු කරන ලදී. එසේ උසස් කරනු ලැබුවේ 1993.10.12 වැනි දින දී ය.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ශ්‍රේණි සංශෝධන අඩංගු ලේඛනය පැ. 16 ලෙස ලකුණු කර ඉදිරිපත් කරයි. සංශෝධිත නව ක්‍රමය යටතේ ශ්‍රේණි 10ක් පෙන්වා ඇත. පැ. 16 දරන නව සංශෝධනය යටතේ, V සහ VI යන ශ්‍රේණි 2ක් මාර්ග පරීක්ෂකවරුන්ට අදාළ කර ඇත. එනම්, VI වැනි ශ්‍රේණිය - මාර්ග පරීක්ෂක සහ V වැනි ශ්‍රේණිය - ජ්‍යෙෂ්ඨ මාර්ග පරීක්ෂක වශයෙනි.

මෙතැනින් ඔහුගේ මූලික සාක්ෂිය අවසන් විය.

ලියනගේ සාක්ෂිකරු හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් අවසන් වරට ලංකා ගමනාගමන මණ්ඩලයේ අවු. 14ක් පමණ සේවය කළ බවත්, එහි බස්රථ පරීක්ෂකවරයකුව සිටි බවත්, පසුව ධාවන සහායක තනතුරට උසස් කළ බවත්, ඒ කාලයේ දී නොයෙකුත් පාඨමාලා හැදෑරූ බවත්, ඔහු පැවසීය, 1997.01.01 වැනි දින සිට විධිමත් ශ්‍රේණිගත කිරීමක් කළ බවත් පැවසීය.

වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් සාක්ෂිකරු, වගඋත්තරකාර අධිකාරියේ කළමණාකරු (පාලන) තිලක් කුමාර වීරසිංහ ය. ඔහු 1998.05.04 වැනි දින වගඋත්තරකාර අධිකාරියට සහකාර කළමණාකරු (පාලන) ලෙස බැඳුණු බවත්, පසුව කළමණාකරු (පාලන) ලෙස උසස්වීමක් ලද බවත්, පැවසීය. වගඋත්තරකාර අධිකාරිය 1992.05.05 වැනි දින ස්ථාපනය කළ බව සාක්ෂිකරු පැවසීය. ඒ අවස්ථාව වන විට මාර්ග පරීක්ෂකවරුන් සිටි බවත්, ඔවුන් II ශ්‍රේණියේ නිලධාරීන් වූ බවත්, පැවසූ ඔහු එවකට පත්වීම් ලබාදීම, ශ්‍රේණිගත කිරීම විධිමත්ව නොපැවති බවත් පැවසීය. විධිමත් ආකාරයකට ශ්‍රේණිගත කිරීම සිදු වූයේ 1997 වර්ෂයේ දී ය. 1997 ශ්‍රේණිගත කිරීම අනුව මාර්ග පරීක්ෂකවරුන් VI වැනි ශ්‍රේණියට පත්වීම් ලද අයවුහ. එවකට මාර්ග පරීක්ෂකවරුන්ට V වැනි ශ්‍රේණිය ලබාදුන්නේ නැත. ඉන්පසුව මාර්ග පරීක්ෂකවරුන් සඳහා V වැනි ශ්‍රේණිය ලබා දී තිබේ. එසේ V වැනි ශ්‍රේණිය ලබාදීමේදී අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සුදුසුකම් මත V වැනි ශ්‍රේණියට උසස්වීම් ලබාදුන් බවත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් සම්බන්ධයෙන් ලිපිලේඛන පරීක්ෂා කිරීමේදී කරුණාදාස

මහතාට V වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුර සඳහා ඉල්ලුම්කර ඇති බවත්, දැන ගන්නට නැත යැයි පැවසීය.

වීරසිංහ සාක්ෂිකරුගෙන් අධිකරණයෙන් අසන ලද, "සාක්ෂිකරු, සාක්ෂිදීමේදී ඔබගේ කරුණු සම්බන්ධයෙන් කියාපාන්නේ ලේඛන උපයෝගී කර ගැනීමෙන් ද ?". යන ප්‍රශ්නයට, "එසේය. ස්වාමීණි." යනුවෙන් පිළිතුරු දී ඇත. ඒ අනුව ඔහුගේ සාක්ෂිය. ගැන දැනුම ලබාගෙන ඇත්තේ යම් යම් ලේඛණ ආශ්‍රයෙන් බව කිය යුතුය.

වගඋත්තරකාර අධිකාරියේ, කළමණාකරු (පාලන) තිලක් කුමාර වීරසිංහ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් අනිත් කරුණු අතර මෙසේ ප්‍රකාශ කර ඇත.

අධිකාරිය ආරම්භයේ දී එහි කටයුතු විමධ්‍යගත කොට පවත්වාගෙන යැම සඳහා නිලධාරීන් 07 දෙනෙකුට උසස්වීම් ලබා දී තිබේ.

ඉල්ලුම්කරුගේ දුක්ගැනවිල්ල ගැන කම්කරු කොමසාරිස්තුමාට කළ පැමිණිල්ල විභාග කිරීමේදී වගඋත්තරකාර පක්ෂය සහභාගි වී සාක්ෂි දුන්නේ ද ?

පැමිණිල්ල පිළිබඳව කම්කරු කොමසාරිස්තුමා, පැ. 24 අනුව, පළමුවරට 2003.07.14 වැනි දින පෙ. ව. 10.00ට සාකච්ඡාවට කැඳවා තිබුණි. පැ. 25 අනුව යළිත් වරක් 2003.07.24 වැනි දින සාකච්ඡාවක් කැඳවා තිබුණි.

පැ. 08 යනු පරීක්ෂණය පැවැත්වූ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්තුමාගේ වාර්තාවයි.

අධිකරණය ඉදිරියේ තබා ඇති සාක්ෂි අනුව නියෝජ්‍ය කම්කරු කොමසාරිස්තුමා විසින් පවත්වන ලද සාකච්ඡා වලට අධිකාරියේ සිටි නිලධාරීන් ඇතුළු තවත් නිලධාරීන් ප්‍රමාණවත් ලෙස සහභාගී වී ඇති බව මම නිගමනය කරමි.

පැ. 27, අනුව VI වැනි ශ්‍රේණියේ වසර 05ක අඛණ්ඩ සතුටුදායක සේවයක් ඇත්නම් ඒ තැනැත්තා V වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුරට අයදුම් කිරීමට සුදුසුකම් ඇති බව සාක්ෂිකරු පවසා ඇත. එනම්, 1997 වසරේ VI වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂකවරයකු වශයෙන් බඳවාගෙන තිබුණේ නම් ඒ තැනැත්තා 2002 වර්ෂයේ නිකුත් කළ R05 දරන ලේඛනය අනුව V වැනි ශ්‍රේණියේ මාර්ග පරීක්ෂක තනතුර ලැබිය යුතු බව එහි සඳහන් වන බව සාක්ෂිකරු පිළිගෙන ඇත.

පැමිණිලිකාර කරුණාදාසගේ වැඩට පැමිණීම සහ හැසිරීම සතුටුදායක බවත් විනය කඩ කිරීම් පිළිබඳ චෝදනා කිසිවක් එල්ල වී නොමැති වූ බවත් කිසියම් විනය දඬුවමකට ඔහු යටත් කර නොමැති බවත් සාක්ෂිකරු පිළිගත්තේ ය.

පැ. 18 (III) දරන පිටුවේ අනු අංක 15 අධිකරණය ඉදිරියේ සාක්ෂිකරු පැමිණිලිකරුගේ නියෝජිත මහතාගේ යෝජනාව අනුව කියවන ලදී.

"වැටුප් විෂමතා ඇතිවීමට හේතු වශයෙන් පැ. 03 වාර්තාවේ සඳහන් වන්නේ 92 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන ප්‍රඥප්තියේ 26(01) වගන්තියෙන් බලය ලබා දී ඇති පරිදි සේවකයන් බඳවා ගැනීමේ සේවා කොන්දේසි හා ඔවුන්ගේ වැටුප් තීරණය කිරීමට හැකියාව තිබූ නමුත් එසේ කිරීමට නොහැකි වූ නිසා මෙම වැටුප් විෂමතාවයන් උද්ගත වී ඇති බවයි. මේ තත්ත්වය යටතේ අසහනකාරී නොසන්සුන්තාවකට විවිධ ශ්‍රේණි වල සේවකයින් 73 දෙනෙකු භාජනය වී ඇති බව පැ. 03 වාර්තාවේ 22 පිටුවේ සඳහන් වේ. මෙම නිලධාරීන් යොමුවේ සඳහන් වන ධාවකයින්ගේ සමිති 06ට ඇතුළත් වන බව පැහැදිලි වේ."

ධාවක සමිති 06 සේවකයින් 73 දෙනා අතරට පැමිණිලිකාර කරුණාදාස මහතා ද ඇතුළත් වූ නිසා තමයි මේ වැටුප් විෂමතාවය අදාල කරගෙන ඔහුට ගෙවා තිබීම හරි බව සාක්ෂිකරු පිළිගත්තේ ය.

මෙතැනින් හරස් ප්‍රශ්න ඇසීම අවසන් වේ.

2010.08.19 වැනි දා තිලක් කුමාර වීරසිංහ සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න ඇසීම අරඹන ලදී.

පැ. 25 අනුව කම්කරු කොමසාරිස්වරයා විසින් ඉල්ලුම්කරුගේ පැමිණිල්ල පිළිබඳව පවත්වන ලද විභාගයේ දී එදින අධිකාරිය නියෝජනය කරමින් හිටපු සාමාන්‍යාධිකාරී හැරී ජයතුංග මහතා සහභාගී වූ බවට අත්සන් තබා ඇති බව පිළි ගත්තේ ය. තවද 2003.07.14 වැනිදා පෙ. ව. 10.00ට පවත්වන ලද සාකච්ඡාවට අධිකාරිය සහභාගී වී ඇති බව ද පිළිගත්තේ ය. මෙසේ හැරී ජයතුංග මහතා කම්කරු කොමසාරිස්වරයාගේ සාකච්ඡා වලට සහභාගී වූයේ ද යන්න පිළිබඳව සාක්ෂිකරු විමසීමක් කළ බවත්, එවිට එසේ සහභාගී වූ බව හැරී ජයතුංග පිළිගත් බවත්, අධිකරණයට හෙළිදරව් කළේ ය.

කම්කරු කොමසාරිස්වරයා විසින් එළඹෙන ලද තීරණ වලට එකඟතාවයක් නොදුන් බව අධිකරණය ඉදිරියේ පැවසීය.

කම්කරු කොමසාරිස්වරයාගේ තීරණවලට එකඟතාවයක් දැක්වූයේ ද යන්න ගැන අධිකරණයට වැදගත්කමක් නැති බවත්, අධිකරණයට වැදගත් වන්නේ එකී සාකච්ඡා වලට අධිකාරිය සහභාගී වූයේද යන්න පමණක් බවත් මම නිගමනය කරමි. කම්කරු කොමසාරිස්වරයාගේ තීරණ ස්වාධීන තීරණයක් බව මෙහිලා මම විශේෂයෙන් අවධාරණය කරමි.

මෙදින නඩු විභාගය අවසන් විය. දෙපාර්ශවය විසින්ම ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවශ්‍ය බව පැවසූ හෙයින් එයට අවසර දුනිමි.

2010 ඔක්තෝබර් මස 29 වැනි දා වගඋත්තරකරු වෙනුවෙන් ලිඛිත දේශනය ඉදිරිපත් කර තිබුණි.

වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයාගේ ලිඛිත දේශනයේ 07 වැනි ඡේදයෙහි සඳහන් කරුණු සිද්ධිමය වශයෙන් සත්‍යයකි. තව ද එහි 08 වැනි ඡේදයේ සඳහන් පරිදි ඉල්ලුම්කරු 1997 දී ශ්‍රේණිගත කිරීමේදී අහෝසි කළ II වැනි ශ්‍රේණිය නැවත ලබාදෙන ලෙස ඉල්ලුම්කරු ඉල්ලා සිටිය බවද නිවැරදිය. තවද 09, 10 යන ඡේද වල එවකට සිටි හැරී ජයතුංග මහතාගේ සාක්ෂි ගෙනහැර දක්වා ඇත. එහෙත් හැරී ජයතුංග මහතාගේ සාක්ෂි සම්පූර්ණයෙන් අත්හැර

දමන ලෙසට මේ නීතිඥවරයාම අධිකරණයට කළ ඉල්ලීමට අධිකරණය අවසර දී ඇත. එබැවින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාක්ෂි සලකා බැලීමට ඉල්ලා සිටීමට නීතිඥවරයා ප්‍රතිබන්ධනය වී ඇත.

තවද, පැ. 08 දරන ලේඛනය සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ පැවති පරීක්ෂණයේ දී අධිකාරියට ප්‍රමාණවත් කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් නොමැති වී ඇති බව පැහැදිලි වන බව කළමණාකරු (පාලන) විසින් පවසා ඇති බවත්, ඒ අනුව ස්වාභාවික යුක්තියේ මූලධර්මයන්ට පවා පටහැණි වන ආකාරයෙන් ඒකපාක්ෂිකව කටයුතු කර ඇති බව ලිඛිත දේශනයේ 22 වැනි ඡේදයේ සඳහන් කර ඇත.

එසේ වුව ද, සාක්ෂිකරු කියනු ලබන එකී කරුණ අධිකරණය විසින් පිළිගන්නේ නැති බව සඳහන් කරනු ලබන්නේ කම්කරු කොමසාරිස්වරයා විසින් පවත්වන ලද සාකච්ඡාවට අධිකාරිය සක්‍රියව සහභාගී වී ඇති බව සැකයකින් තොරව සනාථ වී ඇති බැවිනි.

තවද ලිඛිත දේශනයේ 29 වැනි ඡේදයෙහි සඳහන් ආකාරයට කම්කරු කොමසාරිස්වරයාගේ තීරණ වලට සාමාන්‍යාධිකාරිවරයා එකඟ නොවූ බව සඳහන් වන්නේ නමුත් කම්කරු කොමසාරිස්වරයාගේ තීරණයන් කෙරෙහි සාමාන්‍යාධිකාරීවරයාගේ එකඟත්වය අවශ්‍ය නොවන බව මගේ නිගමනයයි. මන්ද, කම්කරු කොමසාරිස්වරයා ඔහුගේ තීරණ වලට බැස ගත්තේ තමා ඉදිරිපිට තබා ඇති සාක්ෂි මත මිස සාමාන්‍යාධිකාරිවරයාගේ එකඟත්වය මත නොව ස්වාධීන තීරණ වන නිසා බව මම නිගමනය කරමි.

ඉල්ලුම්කරු වෙනුවෙන් සිය ලිඛිත දේශනය 2010 නොවැම්බර් මස 11 වැනිදා ඉදිරිපත් කර ඇත. එහි 08 ඡේදයෙහි (ඉ) අනු ඡේදයේ සඳහන් කරුණු සිය ඉල්ලීමට පාදක වන්නා වූ හේතු ගැන සළකන විට ඉල්ලුම්කරුට V වැනි ශ්‍රේණිය ලබා නොදීම අයුක්තිසහගත යැයි මම නිගමනය කරමි. එසේම එහි සංක්ෂිප්තය සැකවින් යන ඡේදයෙහි (5) අනු ඡේදයෙහි සඳහන් ඉල්ලීම ප්‍රකාර V වැනි ශ්‍රේණිය ජ්‍යෙෂ්ඨ මාර්ග පරීක්ෂක තනතුර ඉල්ලුම්කරුට ලබා දීම යුක්තිසහගත සහ සාධාරණ බව මම නිගමනය කරමි.

මේ කරුණු සියල්ල සැලකිල්ලට ගනිමින් 2004.01.14 වැනි දිනැතිව නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) කම්කරු කොමසාරිස් ජනරාල් වෙනුවට අත්සන් කළ වගඋත්තරකාර අධිකාරියේ සභාපතිවරයා වෙත යවන ලද ලිපියෙහි අඩංගු තීරණයක් මම එකහෙළා අනුමත කරමි. එනම්, "බස්රථ සමිතිවල සේවා කාලය ද අඛණ්ඩ සේවය සේ සැළකිය යුතු බවත්, ඒ අනුව මොහුට 1994 වැටුප් සංශෝධනය ක්‍රියාත්මක වූ දින සිට පළවන ශ්‍රේණියේ උසස්වීම් ලබාදී ඊට අදාළ වැටුප් හා හිඟ වැටුප් ගෙවීමට හා තීරණය කරන බැවින් ඒ අනුව මාගේ නියෝගය පනවමි. තවද, එකී කම්කරු කොමසාරිස්වරයාගේ එකී ලිපියෙහි අවසාන ඡේදයේ සඳහන් වන පරිදි I වැනි ශ්‍රේණිය 1994 සිට හිමි වන අතර, 1997 දී සිදු කරන ලද වැටුප් හා ශ්‍රේණි ප්‍රතිසංවිධානයේ දී ඊට අනුරූපී V වැනි ශ්‍රේණිය හිමි විය යුතු බවත්, 1997 සිට V ශ්‍රේණිය හා ඊට අදාළ වැටුප් හා හිඟ වැටුප් ගෙවීමට කටයුතු කරන ලෙසට වගඋත්තරකාර අධිකාරියට කර ඇති දැනුම් දීම මා අනුමත කරන අතර, ඒ අනුව මාගේ ප්‍රදානය නිකුත් කරනු ලැබේ.

ඉහත දැක්වෙන ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත යැයි මම නිගමනය කර සිටිමි.

එකී කම්කරු කොමසාරිස්වරයාගේ තීරණ දෙක අනුව උසස්වීම් ලබාදීම අදාළ වැටුප් හා හිඟ වැටුප් ගණනය කර මේ ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කිරීමේ දිනයේ සිට මාසයක් ඇතුළත දී වගඋත්තරකාර ආයතනය විසින් ක්‍රියාත්මක කරන මෙන් මෙයින් නියෝග කර සිටිමි.

මේ නඩු විභාගය පැවැත්වීමේ දී ඒ ඒ පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයාට සහ උගත් නියෝජිත මහතාට සහ අදාළ ලඝු ලේඛිකාවන්ට මාගේ ස්තුතිය පිරි නමමි.

කේ. ඒ. ඩී. බී. කරුණාරත්න,
බේරුම්කරු.

2011 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී අත්සන් කරන ලදී.

06-166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.